ශ්‍රී ලංකා විවෘත විශ්වවිද්‍යාලය

ව්‍යවසායකත්වය හා කුඩා ව්‍යාපාර කළමනාකරණය වැඩසටහන
අවසාන පරීක්ෂණය 2007/2008

**MCC 1206 -** ගිණුම්කරණය සහ මූල්‍යය

කාලය : පැය දෙකයි.

---

දිනය : 2008 ජනවාරි 27     වේලාව : ප.ව.01.30 සිට ප.ව.03.30 දක්වා

---

පළමුවන ප්‍රශ්නය ඇතුළුව ප්‍රශ්න 4 කට පමණක් පිළිතුරු සපයන්න.

පහත සඳහන් ශේෂ පිරික්සුම 2007 මාර්තු 31 දායින් අවසන් වසර සඳහා මාතර "රංජිත් එන්ටර්ප්‍රයිසස්" හි පොත්වලින් උපුටා ගන්නා ලදී.

ශේෂ පිරික්සුම

| විස්තරය | හර | බැර |
|---|---|---|
| තොගය 2006/04/01 | 900,000 | |
| මුදල් ශේෂය | 80,000 | |
| බැංකු ශේෂය | 180,500 | |
| ණය ගැතියෝ | 320,000 | |
| ලැබිය යුතු විනිමය බිල් | 130,000 | |
| බොල්ණය | 6,000 | |
| ගැණුම් | 2,850,000 | |
| වරිපනම් | 800 | |
| නීති ගාස්තු | 6,700 | |
| ආපසු එවුම් | 13,200 | |
| ණය පොලී | 6,800 | |
| රක්ෂණය | 7,400 | |
| ගෙන ඒමේ කුලී | 18,500 | |
| ගෙන යෑමේ කුලී | 8,400 | |
| ලිපි ද්‍රව්‍ය | 11,000 | |
| විදුලිය | 23,000 | |
| ගොඩනැගිලි | 1,000,000 | |
| ලී බඩු සහ සවිකිරීම් | 400,000 | |
| රථවාහන | 700,000 | |
| තැපැල් ගාස්තු | 1,800 | |
| **ක්ෂය සඳහා වෙන් කිරීම්** | | |
| ගොඩනැගිලි | | 50,000 |
| ලීබඩු සහ සවිකිරීම් | | 20,000 |
| රථවාහන | | 35,000 |
| ප්‍රාග්ධනය | | 1,500,000 |
| විකුණුම් | | 3,500,000 |
| ණයහිමියෝ | | 300,000 |
| වෙනත් ආදායම් | | 57,100 |
| ගෙවිය යුතු විනිමය බිල් | | 200,000 |
| අඩමාන ණය සඳහා වෙන් කිරීම් | | 2,000 |
| බැංකු ණය (16% වාර්ෂිකව) | | 1,000,000 |
| | 6,664,100 | 6,664,100 |

පහත සඳහන් අමතර තොරතුරු ඔබට සපයා ඇත.

(i) 2007/03/31 ට තොගය රු.400,000/- ක් විය.

(ii) කලින් ගෙවූ වියදම්
    නීති ගාස්තු රු.3,000/-
    වරිපනම් රු.200/-

(iii) 2007/03/31 කට උපචිත වියදම්
    රක්ෂණය රු. 2,000/-

(iv) අඩමාණ ණය සඳහා වෙන් කිරීම් මුළු ණය ගැතියන්ගෙන් 3% ක් විය යුතුය.

(v) සියළුම ස්ථාවර වත්කම් සරල මාර්ග ක්‍රමය මත 5% කින් ක්ෂය කරන්න.

(vi) රු.7,000/- ක් වටිනා භාණ්ඩ අයිතිකරු තම පෞද්ගලික ප්‍රයෝජනය සඳහා ගෙන ගොස් ඇත. මෙය පොත්වල සටහන් වී නොමැත.

ඔබ විසින් පහත සඳහන් දෑ පිළියෙල කල යුතුය.

(අ) 2007/03/31 න් අවසන් මූල්‍ය වර්ෂය සඳහා වෙළඳ හා ලාභාලාභ ගිණුම

(ආ) 2007/03/31 දිනට ශේෂ පත්‍රය

(ලකුණු 40)

02. නුගේගොඩ පිහිටි "රන්ජන් ස්ටෝර්ස් " හි පොත්වලින් පහත සඳහන් දත්ත උපුටා ගන්නා ලදී.

2006/04/01 ට තොගය රු.1,800,000/-
2007/03/31 ට තොගය රු.2,200,000/-
ණය හිමියෝ රු.150,000/-
ණය ගැතියෝ රු.180,000/-
ගෙවිය යුතු විනිමය බිල් රු. 70,000/-
ලැබිය යුතු විනිමය බිල් රු. 90,000/-
ගැනුම් රු. 4,200,000/-
මුළු මෙහෙයුම් වියදම් රු.400,000/-
ප්‍රාග් ධනය රු.1,500,000/-
ශුද්ධ විකුණුම් රු.5,200,000/-

ඉහත සඳහන් දත්ත ඇසුරින් පහත සඳහන් මූල්‍ය අනුපාත ගණනය කරන්න.

(i) දළ ලාභ අනුපාතය
(ii) ශුද්ධ ලාභ අනුපාතය
(iii) ජංගම අනුපාතය
(iv) ක්ෂණික අනුපාතය
(v) ප්‍රාග්ධන ඉපැයුම් අනුපාතය

(ලකුණු 4x5)

03. (i) වෙළඳ හා ලාභාලාභ ගිණුම සහ ආදායම් වියදම් ගිණුම අතර වෙනස පහදන්න.

(ii) උදා. සහිතව ස්ථාවර වත්කම් ක්ෂය කිරීමේ ක්‍රම 2 ක් පැහැදිලි කරන්න.

(iii) මුදල් අයවැයක් පිළියෙල කිරීමේ වාසි සහ අවාසි ලැයිස්තු ගත කරන්න.

(iv) බැංකු අණකරය සහ බැංකු අයිරාව අතර වෙනස සඳහන් කරන්න.

(v) ව්‍යවසායකයකුට ජංගම ගිණුමක් පවත්වා ගෙන යාම තුළින් අත්වන වාසි මොනවා ද?

(ලකුණු 4 x 5)

04. (අ) පහත සඳහන් දත්ත 2007 දෙසැම්බර් මාසය සඳහා උපුටා ගන්නා ලදී.

2007/12/01 ට තොග

| | | |
|---|---|---|
| අමුද්‍රව්‍ය | රු. | 470,000/- |
| අර්ධ නිමි | රු. | 120,000/- |
| නිමි ද්‍රව්‍ය | රු. | 90,000/- |

| | | |
|---|---|---|
| කම්හල් වේතන | රු. | 80,000/- |
| ආපසු යැවුම් | රු. | 6,000/- |
| ගෙන ඒමේ කුලී | රු. | 12,000/- |
| සෘජු වැටුප් | රු. | 76,000/- |
| අමුද්‍රව්‍ය ගැණුම් | රු. | 320,000/- |
| සෘජු වියදම් | රු. | 110,000/- |
| ඉන්ධන | රු. | 70,000/- |
| කම්හල් කුලිය | රු. | 14,000/- |
| විදුලිය | රු. | 11,000/- |
| යන්ත්‍ර ක්ෂය | රු. | 6,300/- |
| මෙවලම් ක්ෂය | රු. | 5,100/- |

2007/12/31 ට තොග

| | | |
|---|---|---|
| අමුද්‍රව්‍ය | රු. | 73,000/- |
| අර්ධ නිමි | රු. | 61,000/- |
| නිමි ද්‍රව්‍ය | රු. | 95,000/- |

ඉහත සඳහන් දත්ත ඇසුරින් 2007/12/31 න් අවසන් මාසය සඳහා නිෂ්පාදන ගිණුම පිළියෙල කරන්න.

(ලකුණු 15)

(ආ) පහත සඳහන් පද අතර වෙනස පැහැදිලි කරන්න.

(i) පාරිභෝජන ද්‍රව්‍ය පිරිවැය සහ ප්‍රාථමික පිරිවැය,
(ii) කම්හල් පිරිවැය සහ නිෂ්පාදන පිරිවැය

(ලකුණු 05)

05. (අ) ව්‍යවසායකයෙකුට මූලික ගිණුම්කරණය පිළිබඳව අවබෝධයක් තිබීම අත්‍යවශ්‍ය වන්නේ ඇයි ?

(ආ) ව්‍යාපාරයක් පුළුල් කිරීමේදී සැලකිල්ලට ගත යුතු සාධක මොනවා ද?

(ඇ) ව්‍යවසායකයෙකුට ආයෝජන විවිධාංගීකරණය වැදගත් වන්නේ කෙසේදැයි පැහැදිලි කරන්න.

(ඈ) දුර්වල මුදල් කළමනාකරණ කටයුතු නිසා ව්‍යවසායකයන් මුහුණදෙන ගැටළු 5 ක් ලැයිස්තු ගත කරන්න.

(ඉ) "ක්ෂුද්‍ර මූල්‍යකරණය"**(Micro financing)** යන්නෙහි අර්ථය පැහැදිලි කරන්න.

(ලකුණු 4 x 5 )

- හිමිකම් ඇවිරිණි. -

UNIVERSITY OF SRI LANKA LIBRARY